ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය

## 16



සිංගප්පූරු ගුවන් තොටට ගොඩ බට මොහොතේ අනුරාධ කළ පළමු කාර්යය නිෂාධිට දුරකතන ඇමතුමක් ගැනීම උත්සාහ කිරීම ය. සිංගප්පූරුවේ දිනක් ගත කරන්නට ඔවුන් යොදාගෙන තිබුණේ මල්වැස්ස අධ්‍යක්ෂණය කළ සුදත්ත ගේ අවශ්‍යතාවටම ය. තමාගේ යම් ව්‍යාපාරික කටයුතු කීපයක් එහිදී කරගන්නට ඔහුට අවශ්‍යව තිබුණි. සිත යට අකමැත්ත සඟවාගෙන සිටින්ට අනුරාධට සිදුව තිබුණේ මනීෂා ද සිංගප්පූරුවේ නැවතී යන්නට දැඩි ඕනෑ කමක් පෙන්නූ නිසා ය.

ගුවන් තොටේ සිය නිෂාධි අමතන්නට අනුරාධ දැරූ උත්සාහය අපතේ ගියේ ඔහු සිත කලබලයට පත් කරවමිනි. නිෂාධිගේ ජංගම දුරකතනය අසාමාන්‍ය ලෙස නිවා දමා තිබෙනු ඔහුට දැනුණි.

අනෙක් දෙදෙනාම සවස් යාමයේ ඇවිදින්නට යන්නට පෙරැත්ත කළ ද අනුරාධ හෝටල කාමරයෙහිම නැවතින්නට උත්සාහ කළේ ය. ඔහුට අවශ්‍ය තිබුණේ කෙසේ හෝ නිෂාධිට දුරකතන ඇමතුමක් ගන්නට ය.

''මේ වගේ වෙලාවකදි විතරයි උඹට විවේකයක් ගන්න ලැබෙන්නෙ.. ඒ චාන්ස් එක අත අරින්න එපා..'' සුදත්ත කීප වතාවක් ම කීවේ ය. ''ආපහු ලංකාවට ගියාම ඉතින් කරත්තෙ බැන්දා වගේ එක දිගටම වැඩනෙ.''

අනුරාධ සිනාසුණේ ය.

''එහෙම වෙන එකකුත් නැහැ.. දැන් තියෙන ටෙලි නාට්‍ය පෝලිම දැක්කම බොහොම ඉක්මනටම අපටත් වැඩ නැති වෙන බව නම් ස්තිරයි'' ඔහු කීවේ ය.

''එහෙම වෙනවා නම් වෙන්නෙ ඉතින් මේ අපි වගේ පුංචි පුංචි අයටනේ.. අනුරාධ අයියලා වගේ ප්‍රවීණ අයට ඉතින් කවදාවත් වැඩ නැති වෙන්නෙ නෑ..'' මනීෂා කීවා ය. ''.. මේ ඔය කතා නවත්තලා යමු ටිකක් එළියට.. අද අපට සුදත්ත අයියා ගානෙ ඩිනර් එක ලැබෙනවලුනෙ.. අධ්‍යක්ෂ මහත්තයෙක් ගානෙ ඩිනර් එකක් ලබෙන්නෙ එහෙමත් වෙලාවකනෙ.. ඒ චාන්ස් එක නම් අතඅරින්න හිතන්නවත් එපා..''

අනුරාධ ඔවුන් සමඟින් එන්නට කැමැත්ත පළ කළේ සිතකින් නොවේ. රාත්‍රී ආහාරය ගන්නටවත් පිරියක් සිතේ නොවී ය. සිත කල්පනාවෙන් බර වී ඇත . අවශ්‍යව ඇත්තේ කොතැනක හෝ තනි වී කල්පනා කරන්නට ය.

සුදත්තත් මනීෂාත් අතොරක් නැති කතාවක පැටලී රාත්‍රී ආහාරය ගනිද්දී අනුරාධ බොහෝ දුර කල්පනාවකට වැටී සිටියේ ය.

*කල්පයක් ගෙවෙන සේ පාළුවම මා දවයි*
*නුඹේ රුව සොය සොයා විපිළිසර සිත හඬයි*
*ගත වෙනා නිමේෂය මහ මෙරක දුක මවයි*
*අනේ නුඹ හමු වනා සොඳුරුතම පැය දුරයි*

*විසිතුරුය දස අතම දකින දේ සොඳුරු නැත*
*නුඹ නොමැති සැඳෑව ද අඳුරින්ම පිරෙනු ඇත*
*සඳවතිය සඟවාන වළාව ද හඬනු ඇත*
*නුඹ සොයා මගේ සිත දසතට ම ඇදෙනු ඇත*

තමා ගේ ගමන් සැළැස්ම අනුරාධ කල් ඇතිව නිෂාධි ට දන්වා තිබුණි. ඇය තමා ගේ පැමිණීම නොයිවසිල්ලෙන් බලා සිටිනා බව ද නිසැක ය. පසුගිය දින කීපයේ ඕනෑම වේලාවක ඇය අමතන්නට ඔහුට හැකියාව තිබුණි. ඇගේ දුරකතනය සෑම මොහොතකම ඔහු වෙනුවෙන් පණ ගැන්වී තිබුණි. එහෙත් අද අවශ්‍යම මොහොතේ අසාමාන්‍ය ලෙස ඇය නිහඬ ය.

අනුරාධ සිත සන්සුන් කරගන්නට වෑයම් කළේ ය. සියල්ල යහපත් අයුරින් සිදුවේවායි පතනවා හැරෙන්නට තමාට කළ හැකි වෙන යම් දෙයක් නැති බව ඔහුට දැනුණි.

0000000000000

දිලීප ට තේ කෝප්පය පිළිගැන්වූ උදාරි බන්දේසිය අතෙහි තබාගෙන මොහොතක් බලා සිටියා ය. ඉන් පසුව නිෂාධි දෙස බලා ගෙතුළට ගියා ය.

''ආපහු යමු..'' දිලීප කීවේ පිරිසිය මත වූ තේ කෝප්ප අනිත් අතින් කරකවන අතර ය. නිෂාධි පිළිතුරක් නොදී ඉවත බලා සිටියා ය. ඇගේ දෑස් කඳුලින් බර ව තිබෙනු ඔහුට පෙනුණි.

*''මට මගේ ගමන යන්න දෙන්න.. ඔයා ඔයාගෙ ගමන යන්න.. අපි දෙන්නට එකතු වෙලා කරන්න දෙයක් දැන් නැහැ දිලීප..''*

''ආපහු ගෙදර යමු නිෂා..'' ඔහු නැවත කීවේ ය. ජනේලයෙන් පිටත ඈත අහස දෙසට යොමුව තිබූ ඇගේ බැල්ම පළමු වතාවට ඔහු දෙසට යොමු විය.

''දිලීප..'' ඈ පහත් හඬින් ඔහු ඇමතුවා ය. ''.. ඔයා ගෙදර යන්න.. මං... මං ආපහු එන්නෙ නෑ දිලීප..''

''හැම දේම අමතක කරලා අලුතෙන් ජීවිතේ පටන් ගමු නිෂා..'' ඈ කී දේ නෑසුණා සේ ඔහු මිමිණුවේ ය.

''අපි දෙන්නට ආයේ එකට ගමනක් නෑ දිලීප.. මට වෛර කරන්න එපා.. මං ඔයා එක්ක ඇති තරම් දුක් වින්දා.. ඔයාට විරුද්ධව එක වචනයක් වත් නොකියා මං දුක් වින්දා.. මේ ලෝකේ කිසි කෙනක් ඒක දන්නෙ නෑ.. දන්නෙ ඔයයි මායි විතරයි.. ඔයාගෙ ගෙදර බිත්ති හතර ඇතුලේ මං හිරවෙලා හිටියා.. කිසි කෙනෙක් දැනගෙන හිටියේ නෑ මං විඳවපු තරම.. ඒත් ඔයා ඒක දැනගෙන හිටියා... ඇයි ආයෙම පාරක් මාව ඒ හිර ගෙදරට ඇදගෙන යන්න හදන්නෙ..? අනේ අනුකම්පාවක් කියලා දෙයක් නැද්ද ඔයා ළඟ..? අනේ දැන්වත් මට මගේ පාඩුවේ ජීවත් වෙන්න දෙන්න දිලීප..''

''ඇයි එහෙම කියන්නෙ..? ඔයා මා එක්ක සතුටින් හිටියෙ නැද්ද...?''

නිෂාධි අවඥාවෙන් සිනාසුණා ය. ඔහු තේ කෝප්පය ටීපෝව මත තැබුවේ ය. ඈ අසළ දණ ගසා ගත් ඔහු ඇගේ දෑත් තම දෑතින් අල්ලා ගත්තේ ය.

''මට ගොඩක් දේ දැන් තේරෙනවා නිෂා.. මගෙන් ගොඩක් වැරදි වුණා.. මං පිළිගන්නවා.. ඒ හැම දේකටම සමාව නොදී ඉන්න  බැරි කමක් නෑ නේ ද? වැරදුණ තැන් හදාගෙන අපට ඉස්සරහට යන්න බැරි ද..?''

ඈ සීරුවෙන් තම දෑත් ඔහුගේ දෑතින් මුදා ගත්තා ය.

''ඔයා කොයි තරම් කිව්වත් ජීවිතේ ඔයාට හදාගන්න බැරි දේවල් තියෙනවා.. මං අමුතුවෙන් කියන්න ඕනෙ නැහැනෙ.. ඒක ඔයා දන්නවා.. මං ඒ හැම දෙයක්ම ඉවසාගෙන හිටියා ඔයා දන්නවා.. මං එහෙම හිටියේ ඔයා ගැන අනුකම්පා කරලා.. ඒවා ඔයාට හදාගන්න බැරි දේ කියලා මං දැනං හිටිය නිසා.. ඒත් ඔයා ඔයාගෙ දුර්වලකම වහගන්න හැදුවේ බලපුලුවන් කාර කමින්.. කාටද ඔයා ඔයාගෙ බලය පෙන්නුවේ... අවුරුදු ගාණක් ඔයා නිසා දුක් විඳපු අහිංසක මට ම නේද ඔයා එහෙම කළේ..? ජීවිතේ එක දවසක මං ඔයාගෙ බැම්මෙන් මිදුනා.. අහම්බෙන්.. හිතන්නෙවත් නැතිව... ආයේ බැඳෙන්නෙ නැති වෙන්නම මිදුනා.. දැන් මගේ හිතට ලොකු සහනයක් දැනෙනවා.. ජීවිතේ සතුට කියන දේ මං දැන් දන්නවා.. මට ආයෙම හැරෙන්න බැහැ දිලීප... මට මගේ ගමන යන්න දෙන්න.. ඔයා ඔයාගෙ ගමන යන්න.. අපි දෙන්නට එකතු වෙලා කරන්න දෙයක් දැන් නැහැ දිලීප..''

ඔහු කිසිවක් කියා ගත නොහැකිව ඇගේ මුහුණ දෙසම බලා සිටියේ ය. ඇයට විරුද්ධව යමක් කියන්නට හැකියාවක් නැති බව ඔහු දනියි.

''ඔයා වගේ කෙනෙකුට තනියම ජීවිතේ ගෙනියන්න මේ රටේ බැහැ.. තේරුම් ගන්න.. ඔයා අමාරුවේ වැටෙයි..''

නිෂාධි සිනාසුණා ය.

''ඔයා ඔය කතා කරන්නෙ ඔයා ළඟ අවුරුදු ගාණක් යටහත් සේවිකාවක් වගේ හිටිය නිෂාධි ගැන.. ඔයා බබෙක් කියලා හිතා හිටිය නිෂාධි ගැන.. නෑ දිලීප.. මං දැන් ගොඩක් වෙනස්.. ඔයාට හිතාගන්නවත් බැරි තරම් මං වෙනස් දැන්.. සඳුදා ඉඳන් මං රස්සාවකට යනවා.. මං ඉක්මනටම නවතින්න කාමරයක් හොයා ගන්නවා.. ඊට පස්සෙ කාටවත් බරක් නොවී ජීවත් වෙන්න මට පුලුවන්..''

දිලීප කල්පනාවෙන් බරවූ සිතින් යුතුය නැගිට්ටේ ය. නිෂාධි විසින් තමා සම්පූර්ණයෙන්ම පරදවනු ලැබ ඇති බව ඔහුට දැනුණි. ඒ සත්‍යය පිළිගත යුතු ද? නැත්නම් එයට එරෙහිව සටන් කළ යුතු ද?

''නිෂාධි...'' දිලීප උස් හඬින් ඇය ඇමතුවේ ය. ''.. ඔයා දන්නවනේ මං කිව්වොත් කිව්ව දේ කරන මිනිහෙක් බව.... මං අද කියන්නං... මං ඔයාට කවදාවත් අර මිනිහා එක්ක එකතුවෙන්න ඉඩ දෙන්නෙ නැහැ.. ඉඩ දෙන්නේ නැහැමයි..'' ඔහු කෝපය සඟවාගන්නට වෑයම් නොකළේ ය. ඔහුගේ දෑස් ගිණියම්ව දිදුලණු ඇය දුටුවා ය. ඇයට අනුරාධ සිහි විය.

*පලා ගිය ජීවිතේ අහඹු සිතුවම් මවා*
*ළඳළු පිරි තුරු වදුළු නගයි දෝ මල් සිනා*
*සලා ගිය පවන් රැල් සුවඳ පොදියට දොවා*
*සෙනෙහසේ පිළිරුවක් ඇඳේ දෝ ලෝ පුරා*

*ළය ගිනි ගෙන දැවුණාමැ යි ගිනි කඳු සේ*
*කතරට වට දිය බිඳ නුඹ අම බිඳ සේ*
*සුවඳයි සඳුන් වනයක ඇති සුවඳක් සේ*
*සුමුදුයි සෙනෙහෙ මල් පෙත්තක් සුසිනිඳු සේ*

දිලීපගේ තර්ජනය හමුවේ නිෂාධි ගේ සිත මොහොතකට සැළුණි. නොසැළී සිටිය යුතු ය යන හැඟීම එසැණින් ඇගේ සිතට ඇතුල් විය. ඔහුට පිළිතුරක් දෙනු වෙනුවට ඇය සැහැල්ලු සිනාවක් මුවේ මවා ගත්තා ය.

වචන දහසකින් කිව නොහැකි කර්කශ කතාවක් ඒ සිනාවේ ගැබ්ව තිබුණේ යයි වාහනයට ගොඩ වන අතර ඔහුට සිතුණි.

000000000000000000

ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළ දිලීප තුන්වන මත්පැන් වීදුරුවත් පුරවා ගත්තේ ය. ඔහු මතක ඇති කාලයක ගුවන්විදුලියට සවන් දී තිබුණේ නැත. නිවසේ තිබූ මේ කුඩා ගුවන් විදිලි යන්ත්‍රය පාවිච්චි කළේ නිෂාධි පමණකි. ඇය සමහර අවස්ථා වලදී එයින් සිංහල ගුවන්

21 වන පිටට